සබරගමුව සහ උතුරු මැද පළාත් සභා පසු ගිය දා ආණ්ඩුව විසුරුවා හැරියේ ඒවායේ නිල කාලය අවසන් වීමට අවුරුදු එක හමාරකට මත්තෙනි. යම් පළාත් සභාවක ආණ්ඩු බලය හිමි පක්ෂයට කටයුතු කරගෙන යාමට නො හැකි පරිදි එම පක්ෂය සුළුතරයක් බවට පත්වන්නේ නම්, ඒ අවස්ථාවේ එම පළාත් සභාවේ බහුතරයක් නියෝජනය කරන ඊ ළඟ පක්ෂයට බලය පැවරිය යුතු බව නීතියේ සඳහන් ය. එහෙත් එ වැනි කිසිවක් මේ පළාත් සභා සම්බන්ධයෙන් අනුගමනය කෙරුණේ නැත. ජනාධිපතිවරයා ගේ හිතුමතය එක ම නීතිය වී පළාත් සභා දෙක විසිරුවා හැරුණි.

සියලු කටයුතු අද සිද්ධ වන්නේ එයාකාරයෙන් බව මුළු රට ම දනී. ඒ සඳහා විද්වත් පැහැදිලි කිරීම් අවශ්‍ය නැත. මන්ද යත්, 1977 සිට මේ සූත්‍රය අනේක වාරයක් ජනතාව අත්දැක ඇති බැවිනි.

රිදී තිරයේ ඩබල් ඇක්ටින් යනුවෙන් හැඳින්වෙන රඟපෑමක් ඇත . එක ම පුද්ගලයෙකු චරිත දෙකක් එක වර රඟපෑම ඉන් අදහස් කෙරේ. මුල් වරට මෙ සේ එක පුද්ගලයෙකු චරිත දෙකක් රඟපානු දුටු අවස්ථාවේ මට ඇති වූ අහ්ලාදජනක විස්මය තව මත් මගේ මතකයේ තිබේ. එය අපූරු විස්මයක් වන අතරේ ම එක්තරා විදිහක අපේක්ෂා භංගත්වයක් ද ජනනය කෙළේ ය. එ තෙක් කල් සිනමාව තුළ පවත්වාගෙන ගිය සැබැව එක්තරා දුරටකට මේ ද්විත්ව රංගනයෙන් පළුදු වූ බවක් මට හැඟිණ.

සැබෑ දිවියේ ද්විත්ව රංගන ශිල්පීන් හමු වන විට ඉස්මත්තට එන්නේ, කුහකත්වය, වංචනිකත්වය සහ රැවටිල්ල යන කාරණා ය. එයින් අප තුළ විටෙක කෝපයක් ද, විටෙක ජුගුප්සාවක් ද ඇති කෙරේ. ප්‍රශ්නය තවත් තීව්‍ර වන්නේ, ලංකාවේ දේශපාලන ක්ෂේත්‍රයේ දකින්නට ලැබෙන රංගනයන් ද්විත්ව භාවයටත් එහා යාමයි. එක ම පුද්ගලයාට එක වර චරිත තුනක්, හතරක්, පහක් ආදී වශයෙන් පෙනී සිටිය හැක. ඒ සෑම භූමිකාවක ම එම චරිතය එක සේ සාර්ථක ව රඟපායි . රිදී තිරයේ දී කෙ සේ වෙතත්, දේශපාලනයේ දී මෙය ඔක්කාරය දනවන තරමට අපුල ය.

උදාහරණයක් වශයෙන් වාසුදේව නානායක්කාර නැමැති චරිතය ගන්න. ඔහු වමේ දේශපාලනයේ දැවැන්තයෙකි. තවමත් තමා වාමාංශිකයෙකැ යි ඔහු විශ්වාස කරයි. ඒ විශ්වාසය එකහෙළා සදොස් නැත. හේතුව, ලංකාවේ ඊනියා වාමාංශය තවමත් නිර්වචනය කෙරෙන්නේ, ඉතා සරල නිර්ණායකයක් වන යු .එන්.පී. නො වීම යන ග්‍රාම්‍ය කාරණය මත ය. එහෙත් වාම දේශපාලනය යනු නැති බැරි එකා සහ නැති බැරි කාරණා වෙනුවෙන් කරන දේශපාලනයක් වශයෙන් වඩාත් පුළුල් අර්ථයකින් ගන්නේ නම්, වාසුදේව යනු මේ මොහොතේ දී වචනයේ පරිසමාප්ත අර්ථයෙන් ම දක්ෂිණාංශික දේශපාලනඥයකුට වඩා එක මයිලකින් වත් වෙනස් වන්නේ නැත.

ඔහු යුදවාදී දේශපාලන ව්‍යාපෘතිය එළිපිට දියත් වෙද්දී පවා කොළඹ නගර සභා විරුද්ධ පක්ෂ නායක තනතුරේ වැජඹී තිරිහන් වන විට මා සිතුයේ, යුදවාදය සහ ජාතිවාදය පිළිබඳ ඔහුගේ තේරුම් ගැනීම මගේ තේරුම් ගැනීමට වඩා වෙනස් විය හැකි නිසා, ඒ වැනි යුදවාදී දේශපාලනයක කොටස්කරුවෙකු වීම ඔහුගේ හෘදය සාක්ෂියට බරක් නො වන්නට ඉඩ ඇති බව ය. එහෙත් යුද්ධය සක්‍රීය ආකාරයෙන් දියත් වන විට, ප්‍රජාතන්ත්‍රවාදී මතුමහල ගරාවැටෙන විට සහ උතුරේත් දකුණේත් සාමාන්‍ය වැසියන් බෝම්බවල ගොදුරු බවට පත්වන විට, ඇස්පනාපිට ඔහුගේ බහුවිධ රංගන කෞශල්‍යය පෙනෙන්ට පටන් ගනී.

මේ පාපය සමා කර ගැනීමට කොළඹ කොටුවේ හෝ ලිප්ටන් වටරවුමේ නැත හොත් මර්වින් සිල්වාට විරුද්ධ ව ජාතික රූපවාහිනිය ඉදිරිපිට විරෝධතා ව්‍යාපාරයකට සහභාගී වීම සෑහෙති යි මේ හිටපු විප්ලවවාදියා සිතන්නේ නම්, එය කරුණු කාරණා අවබෝධ කර ගැනීමේ අවුලක් නො ව, නග්න අවස්ථාවාදයේ ප්‍රකාශනයක් වීමට ම සුදුසුකම් ලබන්නේ ය. චම්පික රණවක සහ විමල් වීරවංශ වැනි කෝඩුකාරයන් රට කරවන්නන් බවට පත් වන විට තමන් වැනි හිටපු පතාක යෝධයන්ටත් මස් කට්ටක් හෝ දෙන්නේ නම් එය බාර නොගෙන සිටීමට තරම් වාම එඩිය තව දුරටත් සවිමත් නැති බව දැන් ඔහුගේ ඇඟට දැනෙන යථාවක් විය හැක. ඒ නිසා ම දෝ, තවත් මයිලක් ඉදිරියට ගොස් අද වන විට ඔහු ආණ්ඩුවේ මහ ඇමති අපේක්ෂකයා වශයෙන් සබරගමුවට යාමටත් බස් දී තිබේ.

**අවංක භාවය යනු කුමක් ද?** එක විට ප්‍රතිවිරුද්ධ කාරණා දෙකකට අවංක වීමට කෙනෙකුට අවශ්‍ය කරන්නේ ඇයි? බලය පතන්නේ බලය සඳහා ම පමණක් ද, නැත් නම් බලය හරහා යම් සේවයක් රටට සිදු කිරීම සඳහා ද? යහ පාලනය වෙනුවෙන්, ජාතික සහජීවනය වෙනුවෙන්, දේශපාලන විසඳුමක් වෙනුවෙන් කලක් පෙනී සිටි ජී.එල්.පීරිස්, උතුරු මැද සහ සබරගමු පළාත් සභා කල් පිරීමට මත්තෙන් විසුරුවා හැරීම ගැන කියන්නේ මෙ සේ ය. 'චන්දය පාවිච්චි කිරීමට ජනතාවට අවස්ථාවක් ලබා දීම ජනතා ස්වෛරීත්වය උරගා බැලීමට අවකාශයක් ලබා දීමකි. ප්‍රජාතන්ත්‍රවාදයට හිතැති කිසිවෙක් ඊට විරුද්ධ වන්නේ ඇයි?'

මෙ මහාචාර්යවරයා උන්නතිකාමී දේශපාලකයෙකු මිස දේශපාලනඥයෙකු නො වුණත්, අඩු වශයෙන් නීති වේදියෙකු වශයෙන් වත්, මිනිස් දිවට කශේරුකාවක් නැති බව මෙ තරම් සරල ව ලෝකයාට හෙළිදරව් කිරීමට ඉදිරිපත් විය යුතු නැත. තමා ලද ජනතා ස්වෛරීත්වයේ වරම ඒ ජනතා අභිලාෂයට පටහැනි තැනක උකසට තබා භුක්ති විඳින අතරේ ඔවුන්ට ම ආපසු හැරී මෙ සේ නින්දා කිරීම මොන තරම් අශීලාචාර ද? ඕනෑ ම චන්දයක් ජනතා ස්වෛරීත්වය සඳහා පාලකයන් විසින් ප්‍රදානය කෙරෙන දුර්ලභ අවස්ථාවක් වශයෙන් සලකා ඔහු කියන පරිදි මිනිසුන් උදම් ඇනිය යුතු නම්, ජනාධිපතිවරණය හෝ මහ මැතිවරණයත් කල් පිරීමට මත්තෙන් අද හෙට පවත්වා ඒ ජනතාවට ඔය කියන ස්වෛරීත්වයේ නිදහස වඩාත් හොඳින් භුක්ති විඳීමට දෙන්නැ යි විරුද්ධ පක්ෂ ඉල්ලූවොත් මේ නීති මහාචාර්යවරයා කියන්නේ කුමක් ද?

ලංකාවේ විවිධ දේශපාලනඥයන් විවිධ කරුණු අරභයා ලෝකයාට අභියෝග කිරීම, තර්ජන ගර්ජන පෑම දැන් කාලයක සිට සිදු කෙරේ. ඒ වෙනුවෙන් මේ වන විට ජිනීවා නුවර වෙන ම තනතුරක් ද ඇති කොට තිබේ. එහි මුල් පුටුව හොබවන්නේ, ජී.එල්. පීරිස් සේ ම, බලයේ තේජස පස්සේ හති හලමින් පැන්නීම ජීවිකා වෘත්තිය කර ගත්, දයාන් ජයතිලක ය. කලක් මොහු උග්‍ර ස්ටැලින්වාදියෙකි. තවත් කලක් ප්‍රේමදාසවාදියෙකි. දැන් රාජපක්ෂවාදියෙකි. ඔහුගේ අලුත්ම රාජ්‍ය තාන්ත්‍රික විස්කම වන්නේ, බ්‍රිතාන්‍ය මහ රැජිණ ගේ ඔටුන්න ගැලවිය යුතු බවට බ්‍රිතාන්‍ය ජනතාවට ප්‍රසිද්ධියේ යෝජනා කිරීමයි. රජවරු සහ රැජිණියන් නාමමාත්‍ර වශයෙන් වත් නූතනත්වයට නො ගැලපෙන බව ලියුම්කරු ගේ පෞද්ගලික මතය වුවත්, සුදු වැන් එවා මිනිසුන් උස්සන, රජ මාළිගයට ම මාධ්‍ය කරුවන් කැන්දා තර්ජන පාන, මහ දවල් මානව හිමිකම් උල්ලංඝනය කරන, සුළුජාතික අයිතීන් සමග

මාරාන්තික සෙල්ලම් කරන සැබෑ රජවරුන් ගේ කේවට්ටයන , ‘‘ලෝකෙට පරකාසේ වීම පැහීරි ත්‍රාසෝන්මාදයට වැඩි යමක් නො වන බව නො කිව මනා ය. ඊටත් වඩා, හැම අවුරුද්දක ම වේ ගෙවාරා සිහිපත් කරමින් පරණ පුරුද්දට අනුස්මරණ ලිපියක් ලිවීමට අමතක නො කරන විද්වතුන් මෙ වැනි භාවිතයක නියැළීම හාස්‍යෝත්පාදක ය.

email : gviyangoda@hotmail.fr